# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/49 - 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, 2020.10.07 දිනැති අංක 2196/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3A පිටුවේ අංක 10 - 850 යටතේ පළ කරන ලද නිවේදනයේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 83.25ක් යනුවෙන් සඳහන් වුවත්, එහි ප්‍රමාණය "රූඩ් 02 පර්චස් 38.5" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : 5/2/KY/12.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 12 - 0178

## 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, මහඔය ජලසම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/MT/332.
2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 136, කැලවින්න ග්‍රාම නිලධාරි වසමේ නිල්ඔබ බංගලායාය ගමේ පිහිටි T.P.P. 24 සැලැස්මේ කැබලි අංක 808 ලෙස දැක්වෙන නිල්ඔබ නමැති ඉඩමෙන් පර්චස් 90ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : කැබලි අංක 805 ;
*නැගෙනහිරට* : රජයේ ඉඩම ;
*දකුණට* : කැබලි අංක 809 ;
*බටහිරට* : කැබලි අංක 809.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ටී. බී. ධර්මසිරි,
අංක 1 - C,
නිල්ඔබ,
මහඔය.

EOG 12 - 0179

---

## 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ගම්පොල ජයමාලපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අම්බුළුවාව ජල ගබඩා ටැංකිය (සිංහපිටිය උතුර) ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/333.
2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

## උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1127, සිංහපිටිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සිංහපිටිය වත්ත ගමේ පිහිටි, "සිංහපිටිය වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 10ක් පමණ වන ඉඩම් කොටස.

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. නීතිඥ අනුරාධ ජයරත්න (පා.ම.),
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන
රාජ්‍ය අමාත්‍ය,
අංක 11, ජාවත්ත පාර,
කොළඹ 05.

EOG 12 - 0180

---

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියට අනුව ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2021.03.12 දිනැති හා අංක 2218/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3A පිටුවේ අංක 03 - 697 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩම පිහිටි ග්‍රාම නිලධාරි වසම අංක 553A මොරටුවැල්ල උතුර ලෙස සඳහන් වුවත් එය අංක 552 ඉඩම ලෙස නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/CO/73.

2021 දෙසැම්බර් මස 16 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 12 - 0181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.